**ශීර්ෂය - 201 - බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 02 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 08 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

---------------------------------

**(අ) මූල්‍ය නොවන වත්කම්**

මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 31 දින වන විට වෙනත් ආයතන වෙතින් පවරාගෙන තිබුණු පිළිවෙලින් රු.4,000,000 ක්, රු.6,000,000 ක් සහ රු.4,500,000 ක් වූ වාහන 03 ක වටිනාකම මූල්‍ය නොවන වත්කම් තුලට ඇතුළත් නොකිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් සඳහන්ව තිබුණි. | අංක KA 7159, KI 4781 සහPA 2741 දරන වාහන 03 හි පිළිවෙලින් රු.4,000,000, රු.6,000,000 සහ රු.4,500,000 යන වටිනාකම් 2022 මැයි මසදී CIGAS ගිණුම් මෘදුකාංගය යටතේ ගිණුම්ගත කර අදාළ ලේඛනවලද ඇතුළත් කර ඇත. | සියළු වාහනවල වටිනාකම විධිමත් පරිදි තක්සේරු කර ගිණුම්ගත කළ යුතු බව. |
| **(ii)** | දෙපාර්තමේන්තුව සතුව පැවති අංක LI 4418 දරන ලොරි රථය 2021 සැප්තැම්බර් 02 දින අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත පවරා දී ඇතත් මෙතෙක් මූල්‍ය නොවන වත්කම්වලින් ඉවත් නොකිරීම හේතුවෙන් එහි වටිනාකම වූ රු.1,176,000 ක ප්‍රමාණයෙන් මූල්‍ය නොවන වත්කම් වැඩියෙන් සඳහන්ව තිබුණි. | අදාල ලොරි රථයේ රු. 1,176,000 ක් වූ වටිනාකම මූල්‍ය නොවන වත්කම් තුලින් ඉවත් කිරිමට 2022 මැයි මස CIGAS මෘදුකාංගය මඟින් කටයුතු කර ඇත. | වෙනත් ආයතනවලට පවරා දෙන ලද වත්කම් ගිණුම්වලින් ඉවත්කිරිම සඳහා කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 වියදම් කළමනාකරණය.

-------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, ඇස්තමේන්තු සකස් කිරීමේදි හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කළ යුතු වුවත් වැය විෂයයන් 28 කට අදාල මූලික සහ සංශෝධිත වියදම් ඇස්තමේන්තු අතර විචලතාවය සියයට 11 සිට සියයට 241 දක්වා පරාසයක පැවතුණි. | 2021 අගෝස්තු 21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව වියදම් සීමා කිරීම අනුව ඉතිරිවීම. | ඇස්තමේන්තු පිළියෙල කිරීමේදි හැකිතාක් නිවැරදිව පිළියෙල කළ යුතු බව. |
| (ආ) | ඇස්තමේන්තු ප්‍රතිපාදනවලින් මු.රෙ 66 යටතේ 201-2-10-2205 වැය විෂයය සඳහා මාරු කර තිබූ රු.280,000 ක ප්‍රතිපාදන මුදලම වියදම් නොකර ඉතිරි කර තිබුණි. | සිල්මාතා ආරාමය සඳහා විදුලිය සැපයීමට අදාලව මාතර දිස්ත්‍රික් ලේකම්ගේ දැනුම් දීම මත ප්‍රතිපාදන මාරු කළද මුලටියන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අක් මුදල් නොලැබීම හේතුවෙන් ගෙවීම් කළ නොහැකි වී ඇත. | ඇස්තමේන්තු ප්‍රතිපාදන උපයෝජනය සම්බන්ධව සැලකිලිමත්වී මාරු කිරීම් සඳහා කටයුතු කළ යුතු බව. |

### 2.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදි නිරීක්ෂණය වු නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 1646 | දෛනික ධාවන සටහන් සෑම මාසයක් අවසන් වී ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | නියමයන් පරිදි කටයුතු කිරීමට උපදෙස් ලබා දී ඇත. | මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 **දෙසැම්බර් 29 දිනැති අංක** 30/2016 **දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.3 වගන්තිය** | ඉන්ධන භාවිතයේ අහිතකර වෙනසක් ඇත්නම් එය හඳුනාගැනීම සඳහා චක්‍රලේඛයෙහි ඇමුණුම 01 හි දක්වා ඇති ප්‍රවාහන සේවා සටහන මාසිකව සම්පූර්ණ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය පරිදි අදාල ප්‍රවාහන සේවා සටහන් සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි**.** | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම**

-------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සේවය හැර ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් 2021 දෙසැම්බර් 31 දිනට අය විය යුතු වර්ෂ 02 සිට වර්ෂ 03 දක්වා වු කාල පාරාසයකට අයත් එකතුව රු.262,686 ක ණය ශේෂය අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණු අතර 2019 සැප්තැම්බර් 01 දින මිය ගිය නිලධාරියෙකුගේ රු.14,330 ක ණය ශේෂය අයකර ගෙන නොතිබුණි. | සේවය හැරගිය නිලධාරීන් දෙදෙනා සම්බන්ධව නිතීමය පියවර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර මිය ගිය නිලධාරීනියගේ ණය ශේෂය මරණ පාරිතෝෂිකයෙන් අයකර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. | ණය ශේෂ නිරවුල් කර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතු බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

**-----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රු. මිලියන 74.96 ක් වැය කර කැලණිය ඊරියවැටියේ ඉදිකර තිබුණු දසසිල් මාතා මූලස්ථානය හා පුහුණු ආයතනයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර දෙපාර්තමේන්තුව වෙත භාරදී වර්ෂ 6 කට වැඩි කාලයක් ගතවී තිබුණද, අපේක්ෂිත පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. | 2014 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු අවසන් කර දෙපාර්තමේන්තුව වෙත බාර දුන්නද 2019 වර්ෂය දක්වා ගොඩනැගිල්ලේ විවිධ ඉදිකිරීම් කටයුතු සිදු කිරීම හා පුහුණු කිරීම් සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින අවස්ථාවේදී කොරෝනා වසංගතය ඇතිවීම නිසා වැඩසටහන් ආරම්භ කිරීමට නොහැකි විය. | අදාල අරමුණ ඉටුකර ගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු බව. |

## 3.2 ප්‍රසම්පාදනයන්

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මහා නායක වාරිකාරාමය ප්‍රතිසංස්කරණය | | |
| (i) රු.16,380,626 ක මුදලක් වැය කරමින්, බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන මහා නායක වාරිකාරාමය ප්‍රතිසංස්කරණය සිදු කරන පාර්ශවය වන නාවික හමුදාව සමඟ, බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හෝ බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 ප්‍රකාරව ලිඛිත ගිවිසුමකට හෝ එකඟතාවයකට එළඹ නොතිබුණි. | දෙපාර්ශවය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට සාකච්ඡා කළද නාවික හමුදාව එවැනි ගිවිසුම් සඳහා අත්සන් නොකරන බව නිලධාරීන් විසින් දැනුම් දෙන ලදි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් ගිවිසුමකට එළඹිය යුතු බව. |
| (ii) ඉහත සඳහන් අළුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් 4.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කර නොතිබුණු අතර 2021 අප්‍රේල් මාසයේදී ආරම්භ කර තිබු අළුත්වැඩියා කටයුතු මෙම වාර්තාවේ දිනය වනවිටත් නිමකර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සටහනෙහි පිටපතක් පිළිතුර ලෙස ඉදිරිපත් කරමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන ක්‍රියාවන්හි කාල ක්‍රමානුගතව විස්තර කරමින් ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කළ යුතු බව. |

(ආ) දහම්පාසල් පොත් මුද්‍රණය

| | | |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශයට පටහැනිව තරඟකාරී ලංසු කැඳවීමෙන් තොරව 2021 වර්ෂයේදී දහම්පාසල් පෙළපොත් හා දහම්පාසල් අයදුම්පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත රු.202,725,279 ක් ගෙවීම් කර තිබුණි**.** | කෝවිඩ් 19 වසංගත තත්ත්වය සැලකිල්ලට ගෙන කඩිනමින් හා විශ්වාසයකින් යුක්තව රාජ්‍ය ආයතනයකින් දහම් පාසැල් පෙළ පොත් හා අයදුම්පත් මුද්‍රණය කිරීම සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත**.** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව තරඟකාරි ලංසු කැඳවීමේ කාර්යය පටිපාටිය අනුගමනය කළ යුතු බව. |

## 3.3 වත්කම් කළමනාකරණය

---------------------------

වත්කම් කළමණාකරනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා නායක වාරිකාරාමය අළුත්වැඩියා කිරීමේදි එහි තිබූ ගෘහ උපකරණ සහ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ දෙපාර්තමේන්තුවේ නිල නිවාස හා වෙනත් අංශ වෙත මාරු කර තිබුණද ඊට අදාල ලිඛිත සනාථ කිරීම් තබා නොගැනීම හේතුවෙන් භාණ්ඩවල ආරක්ෂාව සම්බන්ධ ගැටළු ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය. | අලුත්වැඩියා කටයුතු සිදු කිරිමේදී සිදුවන හානි වලින් ආරක්ෂා කර ගැනීම සඳහා වෙනත් ස්ථාන වෙත මාරු කර ඇති ගෘහ භාණ්ඩ අළුත්වැඩියා කටයුතු අවසන් පසු නැවත වාරිකාරාමය වෙත යොමුකරන බව හා මහනුවර කොමසාරිස් නිල නිවස වෙත ගෙන ගොස් ඇති ඇඳන් ඉන්වෙන්ට්‍රි මඟින් එම නිල නිවස වෙත භාර දීමට කටයුතු කරන බව දන්වමි. | ගෘහභාණ්ඩ හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වෙනත් ස්ථාන වලට මාරු කිරීමේදි නීත්‍යානුකූලව භාණ්ඩවල ආරක්ෂාව තහවුරු වන පරිදි කටයුතු කළ යුතු බව. |
| (ආ) | නො.115, විජේරාම මාවත, කොළඹ 07 හි පිහිටි මහා නායක වාරිකාරාම ගොඩනැඟිල්ල සහිත ඉඩමේ අයිතිය පවරා ගෙන නොතිබුණි. | මහානායක වාරිකාරාමය ගොඩනැගිල්ල පිහිටි ඉඩම මැනුම්ගත කිරීම සඳහා තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් වෙත දන්වා යවා ඇති අතර, ඒ පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් කටයුතු කිරීම. | ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීම සඳහා කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කැලණිය ඊරියවැටියේ දසසිල් මාතා මුලස්ථානය හා පුහුණු ආයතනය ඉදිකරන ලද ඉඩම දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට 2012 වර්ෂයේදි පූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නායක ස්වාමීන් වහන්සේගේ කැමැත්ත ප්‍රාදේශිය ලේකම්වරයා වෙත දැනුම් දී තිබූ අතර වර්ෂ 09 කට වැඩි කාලයක් ගත වී තිබුණද මෙතෙක් එම අත්පත් කර ගැනිමේ කටයුතු අවසන් කර නීතිමය අයිතිය තහවුරු කරගෙන නොතිබුණි. | ඉඩම අත්කර ගැනීමට අදාලව බුද්ධශාසන ,ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශය ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර ඊට අදාල විෂයභාර අමාත්‍යවරයාගේ ප්‍රකාශය කැලණිය ප්‍රාදේශිය ලේකම් වෙත යොමු කර ඇත. | ඉඩම පවරා ගැනීම සඳහා කඩිනමින් කටයුතු කළ යුතු බව. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ තනතුරුවල පුරප්පාඩු 100 ක් පැවති අතර ඒ තුළ නියෝජ්‍ය හා සහකාර කොමසාරිස් තනතුරු 03 ක්, බෞද්ධ කටයුතු සමායෝජක තනතුරු 52 ක්, සංවර්ධන සහකාර තනතුරු 22 ක් සහ කළමණාකරන සේවා නිලධාරී තනතුරු 12 ක් විය. එසේ වුවද, එම පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. | පුරප්පාඩු පිරවීමට කඩිනමින් කටයුතු කළ යුතු බව. |